සමෘද්ධි සංවර්ධන
දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: **DSD/HO/MF/05/** චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: **2017.09.08** |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2017/11**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්/ බැංකු සමිති කළමණාකරුවන්,**

## <u>2017 ඔක්තෝම්බර් 01 දිනට යෙදෙන ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක කරන කැකුළු/ සිසුරක ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන.</u>

### 1. හැඳින්වීම.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු වැඩසටහනේ, ඉතුරුම් තැන්පතු ඉහළ නැංවීම අරමුණින්, 2017 ඔක්තෝම්බර් මස 01 දිනට යෙදෙන ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව සිසුරක/ කැකුළු ළමා ඉතුරුම් ගිණුම් ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරනු ලබයි.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා තිළිණ ලබාදීම ඇතුළු කරුණු සම්බන්ධව මග පෙන්වීම මෙමඟින් සිදු කෙරේ.

### 2. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වෙන කාල සීමාව

2017 ඔක්තෝම්බර් මස 01 දින සිට 20 දින දක්වා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වේ.

### 3. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ ඉලක්ක.

03.01. මෙම ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ දී ඉතිරි කිරීම් ඒකරාශී කිරීමේදී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

i. දරු දැරියන් සඳහා නව ළමා ගිණුම් ආරම්භ කර, ඉතුරුම් කිරීමට හුරු කිරීම.
ii. දැනටමත් ආරම්භ කර ඇති සිසුරක/ කැකුළු ගිණුම් සඳහා, තැන්පතු මුදල් රැස් කිරීම.
iii. අක්‍රීය ළමා ගිණුම් සක්‍රීය තත්වයකට නැවත පත් කිරීම.

**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ (මානව සම්පත්) | අධ්‍යක්ෂ ජනරාල් | ප්‍රධාන ගණකාධිකාරී | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | කාර්යාලය |
|---|---|---|---|---|---|
| | பணிப்பாளர் (மனிதவளம்) | பணிப்பாளர் தலைமையதிபதி | பிரதான கணக்காளர் | பணிப்பாளர் (குறு நிதி ) | அலுவலகம் |
| | Director (Human Resource) | Director General | Chief Accountant | Director ( Micro Finance) | Office |
| Tel- | 011-2873799 | 011-2871672/2872202 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2873996 | 011-2889002 | 011-2869742 | 011-2887469 | **Hot Line: 011- 2887722** |
| E-mail- | diradmin@samurdhi.gov.lk | dg@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Desktop - Isuri** |

03.02. මෙම වැඩසටහනේදී, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව මෙන්ම බැංකු සමිතිය, දිස්ත්‍රික්ක හා ජාතික මට්ටම දක්වා, ඒ ඒ අංශ විසින් අපේක්ෂිත තැන්පතු ප්‍රමාණයේ ඒකරාශී කරගැනීමට කටයුතු කළ යුතුය. ඉලක්ක සකස් කර, සපුරා ගත යුතුය. සමෘද්ධි ප්‍රජාමූල බැංකු විසින් වසම් සඳහාද අපේක්ෂිත තැන්පත් ප්‍රමාණය ඒකරාශී කිරීමට කටයුතු කල යුතුය.

03.03. එක් එක් සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් අවම වශයෙන් අළුත් ළමා ගිණුම් 50ක් ආරම්භ කිරීමට සැලසුම් කල යුතුය. අළුතින්ම ආරම්භ කරන හා දැනට පවතින ළමා ගිණුම් සඳහා තැන්පතු අවම වශයෙන් රු.300,000 කිරීමට අපේක්ෂා කෙරේ. එසේ වුවද යම් බැංකු බල ප්‍රදේශයකට අයත් ග්‍රාම සේවා වසම් ගණන 10 ට අඩු අවස්ථාවක එක් වසමකට අවම වශයෙන් නව ළමා ගිණුම් 4 ක් බැගින්ද, එක් වසමකින් ළමා තැන්පතු අවම අප්ක්ෂිත මුදල රු.25,000/- බැගින් වන ලෙස ද, සකස් කර ගත හැක. එහිදී සමස්ථ බැංකුවෙහි අපේක්ෂිත තැන්පත් මුදල වසම් ගණන අනුව තීරණය කර ගත හැක.

03.04. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය විසින් තම බල ප්‍රදේශයේ පිහිටි සමස්ථ බැංකුවල අපේක්ෂිත තැන්පතු එකතුව බැංකු සමිතියේ අපේක්ෂිත මුදල විය යුතුය. එම මුදල ඉක්මවා නව ගිණුම් ආරම්භ කිරීම හා තැන්පතු රැස් කිරීමට අවශ්‍ය සහාය බැංකු සඳහා ලබා දිය යුතුය.

03.05. එක් එක් දිස්ත්‍රික්කයේ අපේක්ෂිත තැන්පතු ප්‍රමාණය ලෙස තම දිස්ත්‍රික් බල ප්‍රදේශයේ පිහිටි බැංකු සඳහා දී ඇති අපේක්ෂිත තැන්පතු සියල්ලෙහි එකතුව වියය යුතුය. ඒ අනව, එම අපේක්ෂිත තැන්පතු ප්‍රමාණය සපුරා ගැනීම සඳහා නිලධාරීන් මෙහෙයවීමට කටයුතු කල යුතුය.

## 4. තිළිණ ලබාදීම හා වියදම් දැරීම.

04.01. අදාල නිශ්චිත කාලය තුල රු.500/- ක් හෝ ඊට වැඩි ඉතිරි කිරීම් සඳහා තිළිණය බැගින් ලබාදිය යුතුය.

එහිදී, එක් එක් බැංකුවක රැස් කරන මුළු තැන්පතු මුදලට සාපේක්ෂව 5% නොඉක්මවන මුදලක් තිළීණ සඳහා බැංකු අරමුදලින් වැය කල හැකිය. වියදම් දැරීමේදී, වැය ගිණුම - බැංකු කටයුතු ප්‍රවර්ධන ගිණුමට හර කල යුතුය.

04.02. තැන්පතුකරුවන්ට ලබාදිය යුතු තිළීණ තෝරා ගැනීම බැංකු පාලක මණ්ඩලයේ එකඟතාවය මත මුලා විනිවිද භාවය සුරකෙන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කල යුතුය.එහිදි තැන්පත් මුදල හා වයස් කාණ්ඩය අනුව, ඇමුණුම් 01 හි අධාරකයක් ලෙස දක්වා ඇති තිළිණයන්ද මෙහිදී ලබාදිම සලකා බැලීමට පුළුවන.

04.03. ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ, ළමුන්, දෙමව්පියන් හා පාසැල් දැනුවත් කිරීමට අත් පත්‍රිකාවන් හෝ බැනර් සකස් කිරීම සඳහා රු.3,000/- ක උපරිම මුදලක් බැංකු අරමුදලින් වැයකල හැක.

**5.** **ප්‍රගති වාර්තා ලබාදීම.**

05.01. ඇමුණුම් 02 හි ආකෘතිය භාවිතා කර, බැංකුව විසින් 2017.10.31 දිනට පෙර සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියට ප්‍රගතිය ඉදිරිපත් කල යුතු අතර, බැංකු සමිතිය ආකෘති 03 භාවිතා කර, 2017.11.07 දිනට පෙර වාර්තාව සකස් කර, දිස්ත්‍රික් සමෘද්ධි අංශයට භාර දිය යුතුය.

05.02.දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් ද ඇමුණුම් 03 ආකෘතියම භාවිතා කර එම වාර්තාව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අත්සනින් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට යොමු කල යුතුය. ඒ සඳහා bank@divineguma.gov.lk විද්‍යුත් ලිපිනය හරහා 2017.11.14 දිනට පෙර එවීම අනිවාර්ය බව දන්වමි.

**6.** සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති පිළිබඳ ඇගැයීම් වැඩසටහන හා බැංකු ශ්‍රේණිගත (Grading) කිරීමේදී, මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය ද, බැංකු ඇගැයීමේ වැඩසටහන සඳහා සලකා බලන බවද දන්වමි.

**නීල් බණ්ඩාර හපුහින්න,**
**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත් :-

| | | |
|---|---|---|
| 01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන, කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | - | කා.දැ.ස. |
| 02. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | කා.දැ.ස. |
| 03. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. | - | කා.දැ.ස. |
| 04. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. | - | දැ.ස. හා අ.ක.ස. |
| 05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | - | දැ.ස. හා අ.ක.ස. |
| 06. අධ්‍යක්ෂ, සමාජ සංවර්ධන අංශය, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | - | කා.දැ.ස |

# 2017.ඔක්.01 ජාත්‍යාන්තර ළමා දිනටසමගාමීව ක්‍රියාත්මක කරන ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේ තිළිණ හඳුන්වාදීම.

| තැන්පතු මුදල සීමාව රු. | පාසල් යන ළමුන් (අවු: 05ට වැඩි) | | පාසල් නොයන දරුවන් (අවු: 05ට අඩු) | |
|---|---|---|---|---|
| | තිළිණය | වියදම රු. | තිළිණය | වියදම රු. |
| 500 සිට 1000 දක්වා | පැනක් සමඟ කැටයක් | 50 | කැටයක් | 50 |
| 1001 සිට 5000 දක්වා | වතුර බෝතලයක් | 125 | Toys | 100 |
| 5001 සිට 10,000 දක්වා | කවකටු පෙට්ටියක් | 200 | Caps | 200 |
| 10,001 සිට 15,000 දක්වා | කුඩයක් | 400 | කුඩයක් (ළමා) | 350 |
| 15,001 සිට 25,000 දක්වා | Hot & Cool bottle | 500 | Hot & Cool bottle | 500 |
| 25,001 සිට 50,000 දක්වා | පාසල් බෑගයක් | 1000 | ළදරු පාසල් යන ළමුන්ට පාසල් බෑග් එකක් හා අනිකුත් ළමුන්ට සුදුසු තිළිණයක් | 1000 |
| 50,000 සිට 100,000 දක්වා | Table lamp | 1200 | Table lamp | 1200 |
| 100,000 වැඩි නම් | Table Fan | 3500 | Table Fan | 3500 |

ඇමුණුම **- 02**

**2017 ඔක්තෝම්බර් 01 ජාතික ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ**

**ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය**

**........................................... දිවිනැගුම ප්‍රජා මූල බැංකුව**

| විස්තරය | ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල (රු.) * | වෙනත් |
|---|---|---|---|
| අළුතින්ම විවෘත කරන ලද<br><br>දැනට ක්‍රියාත්මක ගිණුම් සඳහා රැස්කරන ලද | | | |
| එකතුව | | | |

* ඒ ඒ ඉලක්ක වෙනුවෙන් රැස්කරන ලද තැන්පත් මුදල සඳහන් කල යුතුය.

ඇමුණුම **- 03**

**2017 ඔක්තෝම්බර් 01 ජාත්‍යන්තර ළමා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ**

**ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය**

**.............................................. දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය / දිස්ත්‍රික්කය**

| බැංකුවේ නම | අළුතින් ආරම්භ කරන ලද | | දැනට පවතින ගිණුම් සඳහා රැස්කරන ලද තැන්පතු | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල (රු.) | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල(රු.) | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල(රු.) * |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | | | |

* රැස්කරන ඉහළම තැන්පතු මුදලෙහි සිට අඩුම මුදලක් රැස්කරන බැංකුව දක්වා, පෙළගස්වා වාර්තාව සකස් කල යුතුය.